# සම්පත් පැතිකඩ - 2023







## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

## පඬුවස්නුවර නැගෙනහිර

# හැඳින්වීම

පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටුපොත නගරයේ සිට කුලියාපිටිය මාර්ගයේ කි.මී.07 ක් ගිය විටද කුරුණෑගල කුලියාපිටිය මාර්ගයේ පිහිටි හොරොම්බාව හන්දියේ සිට හෙට්ටිපොල මාර්ගයේ කි.මී 13ක් ගිය විටද කුලියාපිටිය හෙට්ටිපොල මාර්ගයේ මූණමල්දෙණිය හන්දියේ සිට කටුපොත මාර්ගයේ කි.මී. 7.5ක් ගිය විටද හෙට්ටිපොල නාරම්මල මාර්ගයේ කි.මී. 07ක් ගිය විටද හමුවන මාවී ඇල මංසන්ධියේ පිහිටා ඇත.

උතුර හා බටහිර දෙසින් පඩුවස්නුවර ද, දකුණ දෙසින් කුලියාපිටිය නැගෙනහිර ද ,නැගෙනහිර දෙසින් බමුණාකොටුව හා වාරියපොල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් මායිම්ව මෙම කාර්යාලය පිහිටා ඇත. මෙම කොට්ඨාසයේ විශාලත්වය වර්ග කි.මී. 102.4938ක් වේ.

කෘෂිකාර්මික ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකි මෙම කොට්ඨාසයේ වී හා පොල් ප්‍රධාන භෝගයයි.කෘෂි හා පාරම්පරික කලාපයක් ලෙස ගත් කල පහත රට අතරමැදි කලාප එල් 3 වත් එල් 4වත් මායිම්ව පිහිටා ඇත.මෙහි වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 35ත් 40ත් අතර වේ. වී ගොවිතැන ප්‍රධාන වශයෙන් සිදු කරන අතර වැව් ජලය සහ අහස් දිය ප්‍රයෝජනයට ගනිමින් වී වගාව සිදු කරනු ලබයි. කොට්ඨාසය පුරා විහිදී යන පරිදි වැව් පද්ධතියක් ඇති අතර එම වැව් සංඛ්‍යාව 198කි.මෙම වැව් ජලය ප්‍රයෝජනයට ගෙන යල මහ කන්න දෙක වී වගාව සාර්ථකව සිදු කරනු ලබයි.එසේ වුවද සමහර කන්නවලදී වී වගාව සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාද ඇත.

වී ගොවිතැනට අමතරව බුලත්,එළවළු,කෙසෙල් ,රටකජු,අල වර්ග ආදී බෝග වගා කෙරෙහි ගොවීන්ගේ නැඹුරුවක් ඇතත් ජල හිඟය ඒ සඳහා අහිතකර ලෙස බලපා ඇත.ආර්ථික රටාව ගත් කල මෙම ප්‍රදේශයේ කෘෂිකර්මය බහුලව ඇතත් සත්ව පාලනය හා වෙනත් සුළු කර්මාන්ත හා කුලී වැඩ වැනි රැකියාවන්හි ජනයා නිරත වී සිටිති. පාරම්පරික කර්මාන්ත ලෙස වළං කර්මාන්තය ද සුළු කර්මාන්ත ලෙස ගඩොල් කර්මාන්තය,පොල් ආශ්‍රිත නිෂ්පාදන, ගල් කැඩීම ආදිය දැක්විය හැකිය.

සත්ව පාලනය ගත් කළ විශාල වශයෙන් කුකුළු පාලනය ,කිරිහරක් පාලනය කොට්ඨාශය පුරා දක්නට ඇත.කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 42ක් පමණ කොට්ඨාසය පුරා ඇති අතර කිරි ගොවීන්ගේ කිරි මිලෙහි මේවන විට ස්ථාවර මිලක් පවතී.

මෙම කොට්ඨාසයේ මුළු පවුල් සංඛ්‍යාව 11050 ක් වන අතර, මුළු ජනගහනය 34101කි.එහි ස්ත්‍රී 17742ක් හා පුරුෂ 16359 කින් යුක්තය.


## 1.1 ඓතිහාසික පසුබිම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වයඹ කලාපයේ දේවමැදි හත්පත්තුවේ ගිරාතලාන කෝරළයට අයත් පඬුවස්නුවර ප්‍රදේශයේ සිංහලයන්ගේ මූලාරම්භය දක්වා ඈතට දිවයන දීර්ඝ ඉතිහාසයක් ඇත. පඬුවස්නුවර නගරයට අයත් පැරණි ගොඩනැගිලි, රජ මැදුරු, මහ පවුරු හා ඓතිහාසික චෛත්‍ය විහාර ආදියේ ශේෂ වූ නටඹුන් එදා පඬුවස්නුවර ප්‍රදේශය පුරා සිංහලයාගේ අතීත සමෘද්ධිය හා වික්‍රමය කියා පායි. ප්‍රදේශයේ ඓතිහාසික වැදගත්කමකින් යුක්ත ස්ථාන වශයෙන් රත්මුළුකන්ද පුරාණ ගල්ලෙන් විහාරය, තිස්සව රජමහා විහාරය දැක්විය හැකිය. තව ද ඓතිහාසික ස්ථාන ලෙස අංගුරුවාගල ශ්‍රී පැරකුම්බා මහා විහාරය ද මොරගනේ පෞරාණික ගල් ඇඳ සහ දෙමටව කන්ද හඳුන්වා දිය හැක.ආගමික අතින් දීර්ඝ ඉතිහාසයක් ඇති මෙම ප්‍රදේශයේ ලක්දිව සිංහල නරේන්ද්‍ර වූ පඬුවස්දෙව් රජු වාසය කල බවට සාක්ෂි ඇත. කොට්ඨාශය පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන ගණන 36කි.


## 1.2 පරිපාලන පසුබිම

පඬුවස්නුවර මැතිවරණ කොට්ඨාශයට අයත් ග්‍රාම නිළධාරි වසම් 39ක් ආවරණය වනසේ 2007 ජනවාරි 30 දින මෙම කාර්යාලය ස්ථාපනය කර ඇත.නමුත් 2014.01.01 දින සිට පඬුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව තිබූ ග්‍රාම නිලධාරී වසම් 03 ක් පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශයට අයත්වී ඇත. ඒ අනුව ග්‍රාම නිළධාරි වසම් 36කින් සමන්විත වේ. කෝරළ වශයෙන් ගත් කල අංගමු කෝරළය සම්පූර්ණයෙන්ම ද උතුරු යටිගහ හා  තිස්සව යන කෝරළවලින් කොටස බැගින් ද ඇතුලත් වන සේ මෙම කොට්ඨාශය නිර්මාණය වී ඇත.ගොවිජන සේවා බල ප්‍රදේශ අනුව ග්‍රාම නිළධාරි වසම් 25ක් කනෝගම  ගොවිජන සේවා බල ප්‍රදේශයද,  ග්‍රාම නිළධාරි වසම් 8ක් මූණමල්දෙණිය ගොවිජන සේවා බල ප්‍රදේශයද ග්‍රාම නිළධාරී වසම් 03ක් පඬුවස්නුවර ගොවිජන සේවා බල ප්‍රදේශයද ආවරණය කරනු ලැබේ.

## 1.3.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම (සිතියම)



## 1.4.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරිපාලන මායිම් (සිතියම)




| | | | |
|---|---|---|---|
| 01. | 1362 | - | ගල්ලැහැපිටිය |
| 02. | 1363 | - | කොළඹගම |
| 03. | 1364 | - | කටුමුළුව |
| 04. | 1365 | - | රනෝරාව |
| 05. | 1366 | - | රත්මල්ල |
| 06. | 1367 | - | මාවීහේන |
| 07. | 1368 | - | දුනුපොත |
| 08. | 1369 | - | පාලාවිටිය |
| 09. | 1373 | - | විල්බාගෙදර |
| 10. | 1374 | - | හංවැල්ල |
| 11. | 1375 | - | මැදගම |
| 12. | 1376 | - | බැද්දේගම |
| 13. | 1377 | - | කොස්දෙනිය |
| 14. | 1378 | - | තිස්සව |
| 15. | 1379 | - | කනෝගම |
| 16. | 1380 | - | කන්දෙගෙදර |
| 17. | 1381 | - | ගලගෙදර |
| 18. | 1382 | - | කණපොතුහැර |
| 19. | 1383 | - | මොරගනේ |
| 20. | 1384 | - | නෙලිබැව |
| 21. | 1385 | - | දෙමටව |
| 22. | 1386 | - | අංගමුව |
| 23. | 1387 | - | විජයඋදාගම |
| 24. | 1388 | - | ගොන්නව |
| 25. | 1389 | - | වැලිවැහැර |
| 26. | 1390 | - | කනෝයාය |
| 27. | 1391 | - | හිඳව |
| 28. | 1392 | - | අඩුක්කනේ |
| 29. | 1393 | - | උඩුගම්පලගෙදර |
| 30. | 1394 | - | වැටැහැපිටිය |
| 31. | 1403 | - | බෝධිමුල්ල |
| 32. | 1404 | - | නින්දවෙල |
| 33. | 1406 | - | අනුක්කන්හේන |
| 34. | 1407 | - | හේනේගෙදර |
| 35. | 1408 | - | මහුලාගම |
| 36. | 1410 | - | කඳුබොඩ |

## 1.5.ග්‍රාම නිලධාරි කොට්ඨාස භූමි ප්‍රමාණය හා ගම් සංඛ්‍යාව

| අනු අංකය | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | භූමි ප්‍රමාණය හෙක්ටයාර් | ගම්මාන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | 1362 | ගල්ලැහැපිටිය | 256.59 | 4 |
| 2 | 1363 | කොළඹගම | 238.36 | 3 |
| 3 | 1364 | කටුමුළුව | 310.62 | 1 |
| 4 | 1365 | රණෝරාව | 191.56 | 5 |
| 5 | 1366 | රත්මල්ල | 200.56 | 1 |
| 6 | 1367 | මාවීහේන | 187.87 | 3 |
| 7 | 1368 | දූනුපොත | 344.94 | 3 |
| 8 | 1369 | පාලාවිටිය | 260.02 | 6 |
| 9 | 1373 | විල්බාගෙදර | 347.13 | 2 |
| 10 | 1374 | හංවැල්ල | 255.61 | 4 |
| 11 | 1375 | මැදගම | 383.11 | 2 |
| 12 | 1376 | බැද්දේගම | 263.22 | 3 |
| 13 | 1377 | කොස්දෙණිය | 411.12 | 2 |
| 14 | 1378 | තිස්සව | 627.16 | 4 |
| 15 | 1379 | කනෝගම | 243.73 | 2 |
| 16 | 1380 | කන්දෙගෙදර | 203.3 | 4 |
| 17 | 1381 | ගලගෙදර | 191.51 | 2 |
| 18 | 1382 | කණපොතුහැර | 254.65 | 3 |
| 19 | 1383 | මොරගනේ | 289.55 | 1 |
| 20 | 1384 | නෙලිබැව | 306.36 | 4 |
| 21 | 1385 | දෙමටව | 240.45 | 3 |
| 22 | 1386 | අංගමුව | 307.58 | 3 |
| 23 | 1387 | විජයඋදාගම | 218.22 | 2 |
| 24 | 1388 | ගොන්නව | 279.11 | 4 |
| 25 | 1389 | වැලිවැහැර | 242.15 | 2 |
| 26 | 1390 | කනෝයාය | 235.25 | 4 |
| 27 | 1391 | හිදව | 301.85 | 3 |
| 28 | 1392 | අඩුක්කනේ | 211.85 | 5 |
| 29 | 1393 | උඩුගම්පලගෙදර | 123.8 | 4 |
| 30 | 1394 | වැටැහැපිටිය | 257.12 | 3 |
| 31 | 1403 | බෝධිමුල්ල | 367.48 | 1 |
| 32 | 1404 | නින්දවෙල | 277.04 | 1 |
| 33 | 1406 | අනුක්කන්හේන | 341.18 | 4 |
| 34 | 1407 | හේනෙගෙදර | 330.07 | 3 |
| 35 | 1408 | මගුලාගම | 454.95 | 1 |
| 36 | 1410 | කඳුබොඩ | 294.31 | 2 |
| එකතුව | | | 10249 | 104 |